**පාඩම: 11. මුල් ළමාවියෙහි පසුවන දරුවෙකු සඳහා ගවුම් පන්නයක් නිර්මාණය කිරීම.**

ක්‍රියාකාරකම - කපා ගන්නා ලද රෙදි කොටස් යොදා ගනිමින් මැසීමේ අනුපිළිවෙල අනුගමනය කරමින් ගවුම මසයි.

පියවර 02 - ගවුමේ කඳ හා සාය කොටස් මූට්ටු කිරීම.

I. සායෙහි අංශ මූට්ටු මසන්න.

II. දත්තු රේඛා ඔස්සේ හීන් නූල් දුවවීමෙන් ඉන රැළි කරන්න.

III. රැළි කරන ලද සායෙහි ඉන, කඳ කොටසෙහි ඉනට අල්ලන්න.

- මෙහිදී කඳ කොටසෙහි විවරය දකුණු පස මතුවන සේ එකමත එක තැබිය යුතුවේ.

IV. 1 CMක් ඇතුළට සිටින සේ වාටිය නවා 2 CMක් පළලට ඇඳුමෙහි වාටිය සකසා අල්පෙනෙති ගසා බොරු නූල් ඇද සිහින්ව වාටි මැස්මෙන් මසන්න.

ඇඳුම මැසීමේදී සැලකිය යුතු කරුණු -

- මූට්ටු කිරීම සඳහා ප්‍රිස්මේන්තු මැස්ම යෙදිය යුතු අතර මහන මැශිමේ ප්‍රිස්මේන්තු මැස්මට සමාන මැස්ම උවද භාවිතා කළ හැකිය.

- වාටි මැසීම සඳහාද වාටි මැස්ස හෝ ප්‍රිස්මේන්තු මැස්ම භාවිතා කළ හැකිය.

**මැසීමේ නිවැරදි අනුපිළිවෙල නම්**

- ඉදිරිපස විසිතුරු කිරීම
- ඉදිරිපස පලුවේ ආර මැසීම
- උරහිස මූට්ටු කිරීම
- පිටුපස විවරය මැසීම
- කර අද්දර නිම කිරීම
- අංශය මැසීම
- අත මැසීම
- සාය කොටස මැසීම
- විවර පියවීම

- ඇඳුමේ නොමැසූ අද්දර නිම කිරීම
- මසනා ලද ඇඳුම අලංකාර කිරීම
- ඇඳුමේ වැඩිපුර ඇති නූල් කපා ඉවත් කර  ඉස්ත්‍රික්ක කිරීම.
- ඇඳුම නවා ඇසුරුම් කිරීම.